CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

## පළාත් සභා සංශෝධන පනත සම්මත කරගැනීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය

***2017 සැප්තැම්බර් 25 වැනිදා, කොළඹ, ශ්‍රී ලංකාව:*** පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත සම්මත කරගැනීමේදී රජය අනුගමනය කල ඉක්මන්කාරී සහ විනිවිදභාවයෙන් තොර ක්‍රියාදාමය පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තම දැඩි සැලැකිල්ල පලකොට සිටී. 2017 සැප්තැම්බර් 20 වන දින පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකකට වඩා වැඩි ඡන්දයකින් මෙම සංශෝධන පනත සම්මත කර ගනු ලැබිනි. කාරකසභා අවස්ථාවේ දී පිළිගන්වනු ලැබූ විශාල සංඛ්‍යාවක් වූ සංශෝධන හේතු කොට ගෙන 2017 ජුලි 10 වන දින ගැසට් කර, 2017 ජුලි 26 වන දින පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබූ සහ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පරීක්ෂාකරනු ලැබූ පනත් කෙටුම්පත, පාර්ලිමේනුතුවේ දී සම්මත වූ පනතට වඩා සැහෙන පමණකට වෙනස් වේ. මුල් කෙටුම්පත් පනතේ අරමුණ වුයේ පළාත් සභා මැතිවරණයන් හිදී 30% ක් වු කාන්තා අපේක්ෂක කොටාවක් සඳහා ඉඩකඩ සැලසීම පමණය. කෙසේ නමුත් ජනතාව අතර පවතින තොරතුරුවලට අනුව (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට අවසාන සම්මත වු පනත දකනට ලැබී නොමැත) සම්මත වූ පනත මගින් පළාත් සභා සඳහා වු මැතිවරණ ක්‍රමය වෙනස්කරනු ලබයි. එමෙන්ම සියලු පලාත් සභාවල කාන්තාවන් සඳහා වු 25% ක කොටාවක් සඳහා ඉඩකඩ සලසයි.

පලමුවෙන්ම කිව යුත්තේ, මිශ්‍ර සමානුපාතික ක්‍රමයකට මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සහ පළාත් සභාවල කාන්තාවන්ට අවම නියෝජනයක් සහතික කිරීම යන දෙකම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සතුටින් පිළිගන්නා බවයි. කෙසේ නමුත් මෙම වෙනස්කම් සිදුකළ ඉක්මන්කාරී ආකාරය නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ මුලධර්මයට පටහැනි වේ. පනත් කෙටුම්පත පිටුපස ඇති ප්‍රතිපත්තිය සම්පුර්ණයෙන්ම වෙනස්කල මෙම සංශෝධනයන් පිළිබඳව යම් මහජන විවාදයක් හෝ පරික්ෂාවක් සඳහා ඉඩකඩ සලසනු පිණිස ඒවා ප්‍රසිද්ධ කරණු ලැබුවේ නැත. එමෙන්ම අදාල ආංශික අධීක්ෂණ කමිටුවලදි පවා ඒවා සාකච්ජාවට භාජනය නොකෙරිනි. මැතිවරණ ක්‍රමය සංශෝධන වැනි බරපතල දේශපාලන සම්මුතීන් සහ ගණිතමය සුත්‍රයන් ව්‍යවස්ථා සම්පාදන භාෂාවට පරිවර්තනය කිරීම අවශ්‍යය කරවන සංකීර්ණ ගැටළු සම්බන්ධව කටයුතු කිරීමේදි මෙම ක්‍රියා පරිපාටිය විශේෂයෙන්ම ප්‍රශ්ණකාරී වෙයි. කෙටුම්පත් කරනු ලබන නීතිකරණයන් ක්‍රියාත්මක කල නොහැකි ඒවා බවට පත් නොවීම සහතික කරණු පිණිස විශේෂ සැලකිල්ලකින් යුතුව කටයුතු කිරීම අවශ්‍ය වෙයි. රජය විසින් අනුගමනය කල පටිපාටිය නීත්‍යානුකූල වුවද එහිදි අනුගමනය කල ක්‍රියාපටිපාටිය නරක පූර්වාදර්ශයක් ඇති කරයි. එමගින් ආණ්ඩුකරණයේදි විනිවිදභාවය කෙරෙහී සහ යම් අර්ථාන්විත ආකාරයකින් නව ආංශික අධීක්ෂණ කමිටු ක්‍රමයට තම සුපරීක්ෂණ සහ වගවීම් භූමිකාව ඉටුකිරීම සඳහා බලය ලබාදීම කෙරෙහි වන රජයේ කැපවීම පිළිබඳව ප්‍රශ්ණ මතු කරවයි.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ''පාර්ලිමේන්තුවේ කෙටුම්පත් පනත් පැනවීමට පෙර සුපරීක්ෂණය'' සඳහා ලැබෙන්නේ සීමිත ඉඩකඩකි. ඒ පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයේ කෙටුම්පත් පනතක් ඇතුලත් කොට දින 7 කට පසුවය. රජය මගින් මෙහිදි අනුගමනය කල ක්‍රියාදාමය මගින් පුරවැසියන්හට මෙම යෝජිත සංශෝධනයන් ශ්‍රේෂ්ඨාධිකරණය මගින් පුනරීක්ෂණය කරවා ගැනීම සඳහා පවතින අවස්ථාව අහිමි කරවනු ලැබිනි. නීති සම්පාදන ක්‍රියාදාමය කෙරෙහි විධායකයේ ආධිපත්‍යය සහ විනිවිදභාවයේ ඌණතාවය පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ අනෙකුත් අය විසින් මින් පෙර පලකරනු ලැබූ කනස්සලු සහගතබව රජය විසින් මෙසේ ශක්තිමත් කොට තහවුරු කරණු ලැබ ඇත.

නීතිකරණයන් කලබලකාරී හා කඩිනම් ආකාරයෙන් නොපැනැවිය යුතු බවත් නීති සම්පාදන ක්‍රියාදාමයේදී පාර්ලිමේන්තුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය භූමිකාවට සහ පුරවැසියන්ගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අයිතිවාසිකම්වලට ගරු කරනු ලැබිය යුතු බවත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නැවත අවධාරණය කොට සිටී.

මෙම පනතේ ප්‍රායෝගික ප්‍රතිඵලය වනු ඇත්තේ අඩුම වශයෙන් මාස 6 කින්වත් පළාත් සභා මැතිවරණයන් කල්දමනු ලැබීමයි. මෙසේ සිදු වන්නේ නව මැතිවරණ ක්‍රමයක්දී මැතිවරණ කොට්ඨාශයන් සීමානිර්ණය කිරීමට සිදුවන අතර එය සංකීරණ හා බොහෝවිට අභියෝගයට ලක්වන ක්‍රියාදාමයක් වන බැවිනි. මෙම කාලය අතරතුරදී තම වසර 5 ක කාලසීමාව අවසන් කරන පළාත් සභාවන්හි බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154L සහ 154M ව්‍යවස්ථාවන් ප්‍රකාර ජනාධිපතිවරයා හා/හෝ පාර්ලිමේන්තුව විසින් භාවිතා කරනු ඇත.

බලය බෙදාහැරීමේ මූලධර්මය සහ භාවිතය කෙරෙහි මෙමගින් බරපතල බලපෑමක් ඇතිවන අතර බලය බෙදහැරීම වෙත වන රජයේ කැපවීම පිළිබඳවද මෙමගින් අහිතකර නිරූපනයක් සිදු වේ. පළාත් සභා මට්ටමේ වන ප්‍රජාතාන්ත්‍රික ලෙස තෝරාපත් කරගන්නා ආයතනයන්හි ඇතිවන මෙම හිඩැස මාස 6 ක් ඉක්මවා දිගින් දිගටම පැවැතීමටද එ මගින් සියලු පළාත් සභාවන් වෙත මෙම තත්ත්වය බලපෑමටද සම්පූර්ණ ඉඩකඩ පවති. අනාගතයෙදි පළාත් සභා ක්‍රමය අඩපන කිරීම සඳහා ඕනෑම රජයකට මෙම තත්ත්වය පූර්වාදර්ශයක් ලෙස ගැනීමට ද පහසුවෙන් හැකි වනු ඇත. මෙම සන්දර්භය තුල (දැනට අක්‍රිය කරණු ලැබ ඇති) 20 වන අණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත් පනත සහ මෙම පනත බලය බෙදාහැරීම වෙත සිදුකරන සැලකිය යුතු තරම්වන ආක්‍රමණය කෙරෙහි සැලකිල්ලක් නොදක්වා දෙමළ ජාතික සන්ධානය (TNA) මෙම පනත සම්මත කිරීමට සහය දැක්වීම ගැටළුකාරි වේ.

මෙම දැඩි ක්‍රියාපටිපාටිය අනුගමනය කරනු ලැබුයේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පැනවීම සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය වන බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරනු ලැබුවාට පසුය යන කරුණ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සැලැකිල්ලට ගනී. රජය විසින් මෙම පනත සම්මත කරනු ලැබුවේ මැතිවරණය කල් දැමීමටය යන සංජානනය මෙමගින් ඇති වේ. පළාත් සභාවන් යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත හා ප්‍රජාත්‍රාන්තික ලෙස තොරාපත් කරගනු ලැබූ ආයතනයන් වේ.

වරින්වර සිතට එන හේතුන්මත හෝ තමන්ගේ උපායමාර්ගික වැරදි යටපත් කරගැනීම පිණිස හෝ බලය බෙදනු ලැබූ ආයතනයන් වෙත අනිසි මැදිහත් වීම් සිදු කිරීම රජයක සුජාත හැසිරීමක් නොවේ. මැතිවරණයන් කල් දැමීම ජනතාවගේ පරමාධිපත්‍ය උල්ලංඝනය කිරීමක් වන අතර එය සිදු කළ යුතුමනම් එසේ සිදු විය යුත්තේ සුවිශේෂී තත්ත්වයන්හිදි පමණි. පළාත් පාලන ආයතනයන් සඳහා මැතිවරණ පැවැත් වීමේ දිනය පිළිබඳ රජයේ නායකයන් විසින් දෙනු ලැබූ පොරොන්දු ගනනාවක්ම ඉටු නොවූ තත්ත්වයන් තුල පළාත් සභා සඳහා මැතිවරණයන් සැබැවින්ම රජය විසින් පොරොන්දු වන පරිදි මාස 6 කින් පවත්වනු ලබනවාද යන්න පිළිබඳ සහතිකයක් නොමැත. මෙම මැතිවරණය පොරොන්දු වූ පරිදි පැවැත්වෙන බවට සහතික කර ගැනීම පිණිස රජය වෙත බලපෑම් කරන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ප්‍රධාන පක්ෂය වන දෙමළ ජාතික සංධානයෙන් වැඩිදුරටත් ඉල්ලා සිටි.

තම පොරොන්දු ඉටු කරමින් පළාත් පාලන මැතිවරණයන් 2018 ජනවාරි මස අවසානයට පෙරද පළාත් සභා මැතිවරණයන් 2018 මාර්තු මස අවසානයට පෙරද පැවැත්වීම සහතික කිරීම පිණිස අවශ්‍ය සියලු පියවරයන් ගන්නා ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජයෙන් ඉල්ලා සිටි. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ගැටළු සම්බන්ධයෙන් වන නීති සම්පාදන ක්‍රියාවලිය පුරවැසියන්ගේ අයිතිවාසිකම් වලට මෙන්ම පාර්ලිමේන්තුවේ භූමිකාවටද ගරු කෙරෙන ආකාරයෙන් සිදු කරන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වැඩිදුරටත් රජය වෙතින් දැඩි ලෙස ඉල්ලා සිටි.